Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 07 - 2024

## ගණිතය

කාලය පැය 02 යි

නම / විභාග අංකය: ..............................................................................................

### I - කොටස

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. සෑම පිළිතුරකටම ලකුණු 02 බැගින් හිමිවේ.

01. සුළු කරන්න. $\frac{7}{12} - \frac{5}{12}$

02. පහත දී ඇති කුලකයේ අවයව වෙන්රූප සටහනක් මගින් නිරූපණය කරන්න.
A = {0 ත් 10 ත් අතර ඇති ඔත්තේ සංඛ්‍යා}

03. 0.75 භාගයක් ලෙස ලියා සරලම ආකාරයෙන් දක්වන්න.

04. I. රූපයේ දැක්වෙන කෝණය නම් කරන්න.

II. එහි ශීර්ෂය නම් කරන්න.




05. 2.05 g ස්කන්ධය මිලිග්‍රෑම් වලින් දක්වන්න.

06. විසඳන්න. $3x - 5 = 7$

07. 2024 වර්ෂයෙන් පසු පෙබරවාරි මාසයට දින 28 ක් යෙදෙන ආසන්නතම වර්ෂය කුමක් ද ?

08. සුළු කරන්න. $12 + 12 \div 2$

09. හිස් තැන් සම්පූර්ණ කරන්න.

පාදවල දිග අනුව (a) ............................ ත්‍රිකෝණයක්

වන අතර (b) ............................ ත්‍රිකෝණයක් වේ.



(a)



(b)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

10. සුළු කරන්න. $7a + 5b - 2a - b + 3$

11. 100 ට අඩු හා 100 ට ආසන්නතම 2 න් හා 3 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාව කුමක් ද ?

12. $\frac{61}{11}$ මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

13. $x = 3$ , $y = 2$ නම් $5x - y + 7$ හි අගය සොයන්න.

14. සඳලි ගේ උපන් දිනය 2012.07.20 වේ. ඇයගේ අයියා ඇයට වඩා අවු 1 මාස 9 දින 23 කින් වැඩිමල් ය. අයියාගේ උපන් දිනය කවදා ද ?

15. සංඛ්‍යා රේඛාව භාවිතයෙන් $(+3) + (-5)$ හි අගය සොයන්න.




16. > , < හෝ = සංකේතය යොදා හිස්තැන සම්පූර්ණ කරන්න.

$4\frac{3}{8}$ ........... $4\frac{1}{3}$

17. ABC යනු සමපාද ත්‍රිකෝණයකි. ABC ත්‍රිකෝණයේ පරිමිතිය 42 cm කි. A, B හා C කේන්ද්‍ර වූ එක සමාන අරයන් ඇති වෘත්ත 3 කි. C කේන්ද්‍රය වූ වෘත්තයේ අරය සොයන්න.




18. 8 m 25 cm දිගැති කම්බියකින් 3 m 50 cm ක් දිගැති කොටසක් ඉවත් කළ විට ඉතිරි කොටසේ දිග සොයන්න.

19. හිස්තැනට ගැලපෙන සංඛ්‍යාව ලියන්න. $835.2 \div$ ............ $= 8.352$

20. වර්ගඵලය 48 $m^2$ ක් වූ සෘජුකෝණාස්‍රාකාර බිම් කොටසක දිග 8 m ක් නම් එහි පළල සොයන්න.

## II - කොටස

- පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයේ නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 16 ක් ද අනිකුත් ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.

01. (a) පහත දැක්වෙන්නේ ABCD ත්‍රිපීසියමකි.




දී ඇති රූපයට අනුව

(i) සමාන්තර රේඛා යුගලක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ලකුණු කර ඇති කෝණ වල විශාලත්වය සලකමින් පහත වගුවේ, දී ඇති කෝණ කුමන වර්ගයට අයත් දැයි ලියා දක්වන්න.

| කෝණය | කෝණ වර්ගය |
|---|---|
| $A\hat{B}C$ | |
| $B\hat{A}D$ | |
| $B\hat{C}D$ | |

(ලකුණු 03)

(iii) ඕනෑම සමාන්තර රේඛා යුගලක් ඇඳීමේදී, ඔබ පන්ති කාමරයේදී භාවිතා කළ යුතු උපකරණ 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(b) (i) අරය 3 cm වූ වෘත්තයක් නිර්මාණය කර එහි කේන්ද්‍රය O ලෙස නම් කරන්න. (ලකුණු 02)

(ii) වෘත්තය මත P නම් ලක්ෂ්‍යයක් ලකුණු කර PO යාකරන්න. (ලකුණු 02)

(iii) PO රේඛාව Q හිදී වෘත්තය හමුවන සේ දික්කරන්න. (ලකුණු 01)

(iv) PO හා PQ රේඛා හඳුන්වා, ඒවා අතර සම්බන්ධය ලියන්න. (ලකුණු 04)

02. (a) සෘජුකෝණාස්‍රාකාර තහඩුවක දිග, එහි පළලට වඩා 8 cm කින් වැඩිය.

(i) තහඩුවේ පළල සෙ.මී. $x$ ලෙස ගෙන, තහඩුවේ දිග $x$ ඇසුරෙන් සොයන්න. (ලකුණු 02)

(ii) තහඩුවේ පරිමිතිය සෙ.මී. 44 නම් ඒ සඳහා $x$ ඇසුරෙන සමීකරණයක් ගොඩනගා, තහඩුවේ පළල සොයන්න. (ලකුණු 04)

(iii) එම තහඩුවේ දිග හා පළල ඇසුරෙන් එහි වර්ගඵලය සොයන්න. (ලකුණු 03)

(iv) එම වර්ගඵලය ඇති වෙනත් සෘජුකෝණාස්‍රාකාර තහඩුවක දිග හා පළල සඳහා සුදුසු අගය යුගලයක් ලියන්න. (ලකුණු 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. (a) (i) $7\frac{1}{3} + 5\frac{3}{4}$ අගය සොයන්න. (ලකුණු 04)

(ii) ටැංකියක උසින් $\frac{7}{8}$ ක් ජලයෙන් පුරවා ඇත. එම ටැංකියේ උසින් $\frac{2}{3}$ ක ප්‍රමාණයක් පාවිච්චියට ගන්නේ නම් ඉතිරි වන ජල ප්‍රමාණය භාග ඇසුරින් දක්වන්න. (ලකුණු 03)

(b) සුළු කරන්න.

(i) $2.837 \times 100$ (ලකුණු 01)

(ii) $2.832 \times 8$ (ලකුණු 03)

04. පහත දැක්වෙන්නේ ABCDEF ගෙබිමකි. එහි පිගන් ගඩොල් ඇල්ලීමට බලාපොරොත්තු වේ.




(i) ගෙබිමේ වර්ගඵලය සොයන්න. (ලකුණු 04)

(ii) ඉහත ගෙබිමෙහි, පැත්තක දිග 50 cm ක් වූ සමචතුරස්‍රාකාර පිගන් ගඩොල් ඇතිරීමට බලාපොරොත්තු වේ. ඒ සඳහා අවශ්‍ය පිගන් ගඩොල් සංඛ්‍යාව සොයන්න. (ලකුණු 04)

(iii) පිගන් ගඩොලක් සඳහා රුපියල් 200 ක් වැඩ වේනම්, පිගන් ගඩොල් සඳහා වැයවන මුදල සොයන්න. (ලකුණු 03)

05. (a) දිග 17 cm ද පළල 15 cm උස 5 cm වූ ඝනකාභ හැඩති වීදුරු කුට්ටියක දළ රූපසටහනක් පහත දැක්වේ.




(i) එම වීදුරු කුට්ටියේ පරිමාව $cm^3$ වලින් සොයන්න. (ලකුණු 03)

(ii) මෙම වීදුරු කුට්ටිය ජලයෙන් පිරී ඇති භාජනයක සම්පූර්ණයෙන් ගිල්වනු ලැබූ විට ඉවත් වන ජල පරිමාව මිලිලීටර් වලින් සොයා, පිළිතුර ලීටර් හා මිලි ලීටර් ඇසුරින් ලියන්න. (ලකුණු 02)

(iii) ඉහත ආකාරයේ වීදුරු කුට්ටි 4 ක් එම ජල භාජනයේ සම්පූර්ණයෙන්ම ගිල්වීමට සැලැස්සූ විට ඉවත් වන ජල පරිමාව ගණනය කරන්න. (ලකුණු 03)

(b) 4ℓ 50 mℓ සිසිල් බීම ප්‍රමාණයක් සර්වසම ඇසුරුම් 6 කට සමාන ප්‍රමාණ වලින් පුරවන ලදී. එක් ඇසුරුමක අඩංගු බීම ප්‍රමාණය සොයන්න. (ලකුණු 03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06. පළතුරු සලාදයක් සෑදීමට එක සමාන ස්කන්ධ වලින් යුත් ගස්ලබු ගෙඩි 2 ක් ද, සමාන ස්කන්ධ වලින් යුත් කෙසෙල් ඇවරි 3 ක් සහ සමාන ස්කන්ධ සහිත අඹ ගෙඩි 7 ක් ද මිලදී ගන්නා ලදී.

| පළතුරු වර්ගය | ස්කන්ධය |
|---|---|
| ගස්ලබු ගෙඩි 1 ක් | 2 kg 97 g |
| කෙසෙල් ඇවරි 1 ක් | 1 kg 7 g |
| අඹ ගෙඩි 1 ක් | 255 g |

(i) ගස්ලබු ගෙඩියක බර g වලින් දක්වන්න. (ලකුණු 02)

(ii) කෙසෙල් ඇවරියක හා අඹ ගෙඩියක ස්කන්ධයන් හි වෙනස සොයන්න. (ලකුණු 02)

(iii) පළතුරු සලාදය සෑදීම සඳහා ගෙන ආ පළතුරු වල මුළු ස්කන්ධය සොයන්න. (ලකුණු 05)

(iv) ඉහත පළතුරු වලින් 1 kg 250 g ක් අපද්‍රව්‍ය ලෙස ඉවත් වූයේ යැයි සලකා සාදන ලද සලාදය, සිසුන් 50 ක් අතර සමසේ බෙදීමේදී එක් අයකුට ලැබෙන පළතුරු ප්‍රමාණය g වලින් සොයන්න. (ලකුණු 02)

07. 12, 18, 24 යන සංඛ්‍යාවල

(a) (i) මහා පොදු සාධකය සොයන්න. (ලකුණු 03)

(ii) කුඩාම පොදු ගුණාකාරය සොයන්න. (ලකුණු 03)

(b) ඉහත කුඩාම පොදු ගුණාකාරය සඳහා ලැබුණු අගය, පාද ප්‍රථමක සංඛ්‍යා වූ බලවල ගුණිතයක් ලෙස ලියන්න. (ලකුණු 03)

(c) $2a^2b^3$ යන ප්‍රකාශණය ගුණිතයක් සේ විහිදුවා ලියන්න. (ලකුණු 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 07 - 2024

# ගණිතය

**පිළිතුරු පත්‍රය**

| | I කොටස | | |
|---|---|---|---|
| 01. | $\frac{2}{12}$ | 1 | |
| | $\frac{1}{6}$ | 1 | **02** |
| 02. | A  | | **02** |
| 03. | $\frac{75}{100} = \frac{3}{4}$ | 1+1 | **02** |
| 04. | I. $Q\hat{P}R$ හෝ $R\hat{P}Q$ | 1 | |
| | II. P | 1 | **02** |
| 05. | 2050 | | **02** |
| 06. | $3x = 12$ | 1 | |
| | $x = 4$ | 1 | **02** |
| 07. | 2028 | | **02** |
| 08. | 12 + 6 | 1 | |
| | 18 | 1 | **02** |
| 09. | (a) සමද්විපාද | 1 | |
| | (b) විෂම | 1 | **02** |
| 10. | 5a + 4b + 3 | | **02** |
| 11. | 96 | | **02** |
| 12. | $5\frac{6}{11}$ | | **02** |
| 13. | $5 \times 3 - 2 + 7$ | 1 | |
| | 20 | 1 | **02** |
| 14. | 2010. 09. 27 | | **02** |
| 15. | සංඛ්‍යා රේඛාව මත දැක්වීම | 1 | |
| | (-2) | 1 | **02** |
| 16. | > | | **02** |
| 17. | $\frac{42}{3} = 14$ | 1 | |
| | 7 cm | 1 | **02** |
| 18. | 4 m 75 cm | | **02** |
| 19. | 100 | | **02** |
| 20. | 48 / 8 | 1 | |
| | 6 m | 1 | **02** |

| | | II කොටස | | |
|---|---|---|---|---|
| 01. | (a) | | | |
| | (i) | AD හා BC | 2 | |
| | (ii) | මහා කෝණය, සුළු කෝණය, සෘජු කෝණය | 3 | |
| | (iii) | සරල දාරය, විහිත චතුරස්‍රය | 2 | **07** |
| | (b) | | | |
| | (i) | නිවැරදි වෘත්තයට හා කේන්ද්‍රය නම් කිරීම | 2 | |
| | (ii) | P ලකුණු කිරීම | 1 | |
| | | PO යා කිරීම | 1 | |
| | (iii) | PO, Q තෙක් දික්කිරීම | 1 | |
| | (iv) | PO - අරය | 1 | |
| | | PQ - විෂ්කම්භය | 1 | |
| | | 2PO = PQ | 2 | **09** |
| | | | | **16** |
| 02. | (i) | $x + 8$ | | **02** |
| | | $x + x + 8 + x + x + 8 = 44$ | 1 | |
| | | $4x + 16 = 44$ | 1 | |
| | | $4x = 28$ | 1 | |
| | | $x = 7$ | 1 | **04** |
| | (iii) | 7 + 8 = 15 (ආදේශය) | 1 | |
| | | $7 \times 15$ | 1 | |
| | | $105 \text{ cm}^2$ | 1 | **03** |
| | (iv) | නිවැරදි පිළිතුරු යුගලයට | | **02** |
| | | | | **11** |
| 03. | (a) | | | |
| | (i) | $11\frac{1}{12}$ (නිවැරදි පියවර සඳහා කොටස් ලකුණු හිමිවේ) | | **04** |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

| | | | | |
|---|---|---|---|---|
| | (ii) | $\frac{5}{24}$ (නිවැරදි පියවර සඳහා කොටස් ලකුණු හිමිවේ) | | **03** |
| | (b) (i) | 283.7 | | **01** |
| | (ii) | 0.354 | | **03** |
| | | | | **11** |
| 04. | (i) | 10 × 8 + 4 × 3 | 2 | |
| | | 80 + 12 | 1 | |
| | | 92 $m^2$ | 1 | **04** |
| | | (හෝ සුදුසු ක්‍රමයක්) | | |
| | (ii) | 20 × 16 + 8 × 6 | 2 | |
| | | 320 + 48 | 1 | |
| | | 368 | 1 | **04** |
| | | (හෝ සුදුසු ක්‍රමයක්) | | |
| | (iii) | 368 × 200 | 1 | |
| | | = රු. 73600 | 2 | **03** |
| | | | | **11** |
| 05. | (a) | | | |
| | (i) | 17 × 15 × 5 | 1 | |
| | | 1275 $cm^3$ | 2 | **03** |
| | (ii) | 1275 mℓ | 1 | |
| | | 1ℓ 275 mℓ | 1 | **02** |
| | (iii) | 1ℓ 275 mℓ × 4 | 1 | |
| | | 5ℓ 100 mℓ | 2 | **03** |
| | (b) | 4ℓ 50 mℓ ÷ 6 | 1 | |
| | | 675 mℓ | 2 | **03** |
| | | | | **11** |
| 06. | (i) | 2097 g | | **02** |
| | (ii) | 752 g | | **02** |
| | (iii) | (2097 × 2) + (1007 × 3) | | |
| | | + (255 × 7) | 2 | |
| | | 4194 + 3021 + 1785 | 2 | |
| | | 9000 g | 1 | **05** |
| | | (හෝ නිවැරදි ක්‍රමයකට) | | |
| | (iv) | 155 g | | **02** |
| | | | | **11** |
| 07. | (a) | | | |
| | (i) | 6 ලබා ගැනීම | 3 | |
| | (ii) | 72 ලබා ගැනීම | 3 | **06** |
| | (b) | 72 = 2 × 2 × 2 × 3 × 3 | 2 | |
| | | = $2^3 \times 3^2$ | 1 | **03** |
| | (c) | 2 × a × a × b × b × b | | **02** |
| | | | | **11** |